**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2014**

**-----------------------------------------------------**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 5 දරන පනතින් සංශෝධිත (203 අධිකාරය) මෝටර් වාහන පනතෙහි 213 “අ” වගන්තිය හා 237 වගන්තිය යටතේ 2005 අප්‍රේල් 04 දිනැති රජයේ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 **මූල්‍ය ප්‍රකාශන**

----------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**----------------------------------------------**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු.**
**--------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයේ ගෙවිය යුතු ලෙස හඳුනාගත් මරණ සහ තුවාලකරුවන් වෙනුවෙන් ගෙවිය යුතු රු. 850,000 ක වන්දි මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**--------------------------------------**

වාහන දෙකක් සඳහා ලබාගත් රු.83,400 ක ඉන්ධන සඳහා වාහන අංකය හා දිනය රහිත බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

**2.3. නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1971 අංක 38 දරන මුදල් පනත** | |
| i. 8 (2) වගන්තිය | එකතුව රු. 1,027,785 ක මිලදී ගන්නා ලද වත්කම් ප්‍රක්ෂේපිත අයවැය ලේඛනයේ හෝ ශේෂ පත්‍රයේ |

| | |
|---|---|
| | ඇතුළත් කර නොතිබුණි. |
| ii. 8 (3) වගන්තිය | අදාල ඇමතිවරයාගේ හා මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව රු. 2,904,902 ක මූලධන වියදම් සඳහා බැදීම් ඇති කර ගෙන තිබුණි. |
| iiii. 10 (5) (1) වගන්තිය | 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාව විසින් උපයාගත් ශුද්ධ අතිරික්තය වූ රු. 180,834,459 මුදල ඒකාබද්ධ අරමුදලට බැර කිරීමක් හෝ අතිරික්ත මුදල් තාවකාලිකව භාණ්ඩාගාරයේ තැන්පත් කිරීමක්ද, සිදු කර නොතිබුණි. |
| iv. 10 (5) (1) (ඒ) (බී) වගන්ති | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේ අදාළ ඇමතිවරයාගේ හා මුදල් ඇමතිවරයාගේ එකගතාව නොමැතිව භාණ්ඩාගාර බිල්පත් යටතේ රු. 17,857,585 ක මුදලක් ආයෝජනය කර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 3 සහ 4 | වියදම් සැලැස්මක් හා වැඩසටහන් සැලැස්මක් සකස් කර වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා අත්තිකාරම් ලබා ගත යුතු වුවද, එසේ සැලසුමකින් තොරව රු.556,500 ක මුදලක් සභාව විසින් අත්තිකාරම් වශයෙන් ලබා ගෙන තිබුණු අතර එම අත්තිකාරම් මුදලින් සියයට 65 කට වඩා අඩු මුදලක් වැයකර තිබූ බව නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 135 | සභාව පිහිටුවීමට අදාළ කැබිනට් අනුමැතිය ලැබී වසර 10 ක් ගත වී ඇතත්, අනුමත කාර්යය මණ්ඩලයක් පත්කර විධිමත් පරිදි මූල්‍ය බලතල පැවරීමක් සිදු කර |

| | |
|---|---|
| | නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 138 සහ 139 | වන්දි ගෙවීමේ වවුචර්පත් සහතික කළ බවට හා ගෙවීම් කළ බවට මුද්‍රාව තබා අත්සන් කිරීමකින් තොරව රු. ලක්ෂ 06 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 165 (2) සහ මුදල් රෙගුලාසි 177 (2) | සභාව වෙත ලැබෙන මුදල් ඇණවුම් හා චෙක්පත් සටහන් කිරීම සඳහා පවත්වාගත යුතු චෙක්පත්, මුදල්, මුදල් ඇනවුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 06 කදී ලබා දී තිබුණු වැඩමුළු සහ දීමනා වෙනුවෙන් රු. 481,750 අත්තිකාරම් මුදල් පියවීමට ප්‍රථම නැවත වරක් එම කාර්යය සඳහාම රු. 512,500 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 371 (2) (අ) (ආ) | සුළු මුදල් අත්තිකාරම් ලබාදීම වෙනුවට තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් ලබාදුන් රු. 15,000 ක්ද, සංචිත වාහනයක් සඳහා ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් අවස්ථා කිහිපයකදී රු. 44,000 ක මුදලක් ලබා දී තිබූ නමුත් එම කාර්යයන් අවසන් කර නිරවුල් කිරීමට මාස 1½ සිට මාස 10 ක කාල ප්‍රමාදයන් වී තිබුණි. |
| (vii) මුදල් රෙගුලාසි 371 (5) | සුළු මුදල් අග්‍රිම වශයෙන් 2006 වර්ෂයේදී ලබා දී තිබුණු රු. 2,000 ක මුදල එම වසර අවසානයේදී නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත් දැනට වසර 08 ක් ගත වී තිබුණු එම මුදල සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(viii) මුදල් රෙගුලාසි 752

මිලදී ගන්නා ලද රු. 154,980 ක් වටිනා පාරිභෝජන භාණ්ඩ ලැබීම් අදාළ පාරිභෝජන ද්‍රව්‍ය ලේඛනයෙහි සටහන් කර තිබූ බවට තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

(ix) මුදල් රෙගුලාසි 756 සහ මුදල් රෙගුලාසි 754

සභාව සතුව සමාලෝචිත වර්ෂයේ පැවති රු. 3,074,476 ක වත්කම් හා අනෙකුත් දේපළ වෙනුවෙන් අදාල වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා එම වාර්තාවේ පිටපතක් විගණකාධිපතිට එවීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**I.** මාර්ගෝපදේශ 3.4.1

සාප්පු ක්‍රමය යටතේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා අවම වශයෙන් විවෘත මිල ගණන් 03 ක් මගින් සැපයුම්කරුවන් තෝරා ගැනීමක් කළ යුතු වුවත් එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදී රු. 183,824 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

**II** මාර්ගෝපදේශ 4.2.2

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ රු.මිලියන 22.4 ක අගයකින් යුතු වැඩසටහන් හා ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රසම්පාදන කාල සටහනක් ක්‍රමානුකූලව පිළියෙල කර නොමැතිව මිලදී ගැනීම් සිදු කර තිබුණි.

**(ඈ)** 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම සභාව බදු වලින් නිදහස් කර නොතිබුණු නමුත් ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන්ද, බදු ගෙවීමේ අවශ්‍යතාවය හඳුනාගෙන බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**3** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම්වල මූල්‍ය ප්‍රතිඵලය රු. 27,647,004 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී රු. 33,965,367 ක අතිරික්තයක් වූයෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,318,363 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සභාවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන රක්ෂණ සමාගම්වලින් ලැබෙන දායකත්වය වැඩි වුවද, භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර තැන්පතු පොලී ආදායම පහළ යෑම හා පසුගිය වර්ෂයට සාපේක්ෂව වියදමෙහි සියයට 98 ක ප්‍රමාණයක වර්ධනය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණු බවද, නිරීක්ෂණය විය.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1** **කාර්ය සාධනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **සභාවේ අරමුණු හා කාර්යයන් සඳහා දායකත්වය.**

-------------------------------------------------------

සභාව පිහිටුවීමේ ප්‍රධාන කාර්යයන් 11 ක් නිශ්චිතව හඳුන්වා දී තිබුණද, සභාව ආරම්භ කර වසර 10 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම යන කාර්යයන් 02 ක පමණක් කෙරෙහි අවධානය යොමු කර තිබුණි. අනෙකුත් කාර්යයන් සඳහා දීර්ඝකාලීන සැලැසුමට හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මකට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමකට සැලැසුම් කර නොතිබුණි. සභාව විසින් එම කාර්යයන් මේ වන විටත්

ආරම්භ කර තිබුණ බවට විගණනයට සනාථ නොවීය.එම අරමුණු හා කාර්යයන් පහත පරිදි හදුනාගත හැකිය.

(i) රථවාහන ප්‍රමාණය, මාර්ග අනතුරු, මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.

(ii) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම.

(iii) සම්බන්ධිත විෂයන් පිළිබඳව තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පැවැත්වීම හා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.

(iv) සම්බන්ධිත විෂයන් පිළිබඳව පර්යේෂණවලට ආධාර කිරීම.

(v) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම හා පළපුරුද්ද පිළිබඳව දැනුම හුවමාරු කර ගැනීම.

(vi) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරණ රාජ්‍ය හා රාජ්‍ය නොවන අදාළ ආයතනවලට දැනුම හා තොරතුරු ලබා දීම.

(vii) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(viii) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍ය හා වෙනත් සහය ලබා දීම.

(ix) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් දීම.

**(ආ) වන්දි ගෙවීමේ ප්‍රගතිය.**

**----------------------------**

සභාව සතු මාර්ග රිය අනතුරු පිළිබද සංඛ්‍යා ලේඛන දත්ත විගණනයට ලබා දී තිබුණු අතර එම තොරතුරු මත 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 10 කාල සීමාව තුළ මාරක හා බරපතල අනතුරු 81,459 ක් වාර්තා වී තිබුණි. එහෙත් එම අනතුරුවලින් හදුනා නොගත්

වාහන වලින් සිදු වූ අනතුරු සංඛ්‍යාව කොපමණද යන්න පිළිබඳ තොරතුරු සභාව සතුව නොතිබුණි. 2014 වර්ෂයේදී වාර්තා වූ මාරක හා බරපතල අනතුරු 8,949 ක් විය. එහෙත් එම වර්ෂය තුල වන්දි සඳහා අයදුම්පත් 63 ක් පමණක් ලැබී තිබුණි. කෙසේ වුවද, මෙම වසර 10 ක කාලය තුළ සභාව වෙත වන්දි ඉල්ලීමේ අයදුම්පත් 299 ක් පමණක් ලැබී තිබූ අතර ඉන් අයදුම් පත්‍ර 171 ක් සඳහා පමණක් රු. 8,035,000 ක වන්දි මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවා තිබුණි.

**(ඇ) වන්දි ගෙවීමේ ප්‍රමාදය.**

-------------------------

සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවල ලැබුණු අයදුම්පත් 63 කින් අයදුම්පත් 23 ක් වෙනුවෙන් රු. 1,695,000 ක් සමාලෝචිත වර්ෂයේදී වන්දි වශයෙන් ගෙවා තිබුණි. අයදුම්පත්‍ර ලැබුණු දිනය හා වන්දි ගෙවූ දිනය අතර ප්‍රමාණාත්මක කාල ප්‍රමාදයක් විගණනයේදී නිරීක්ෂණය වූ අතර එම කාල ප්‍රමාදයන් අඩු කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.

පෙර වර්ෂයේදී ලැබුණු වන්දි ඉල්ලුම් අයදුම්පත්‍ර 16 ක් වෙනුවෙන් රු. 1,555,000 ක මුදලක්ද, වන්දි ඉල්ලුම් අයදුම්පත් 03 ක් වෙනුවෙන් වර්ෂ 02 සිට 03 දක්වා කාල පමාවකින් පසුව රු.110,000 ක මුදලක්ද, එක් අයදුම්පත්‍රයක් වෙනුවෙන් වසර 04 ක කාල පමාවකින් පසුව රු.30,000 ක මුදලක්ද, වශයෙන් ගෙවා තිබුණි.

**(ඈ) රක්ෂණ ආදායම් ප්‍රේෂණය කිරීමේ ප්‍රමාදය.**

-----------------------------------------------

(i) 2004 පෙබරවාරි 24 දින අංක 1368/11 දරන ගැසට් නිවේදනයේ ආකෘති පත්‍ර 01 ට අනුව සෑම රක්ෂණ සමාගමක්ම අය කරනු ලබන දායක මුදල් ඊළඟ මස 15 වන දින හෝ ඊට පෙර එවිය යුතු ලෙස සඳහන් කර තිබුණද, සභාව විසින් රු. 189,839 ක ලැබිය යුතු දායක මුදල් එදිනට පෙර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 1998 අංක 05 දරන මෝටර් වාහන පනතේ නියෝග අංක 02 ප්‍රකාරව රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් ප්‍රේෂණය කිරීම වෙනුවෙන් රක්ෂණ සමාගම් විසින් එකතු කර

සභාවට සමාලෝචිත වර්ෂයේදී ප්‍රේෂණය කළ සියයට එකක ආදායම වූ රු.32,447,870 ක ආදායමේ නිවැරදිතාවය සනාථ කර ගැනීමේ ක්‍රමවේදයක් සභාව සතුව නොතිබුණි.

**4.2 කළමණාකරන අකාර්යක්ෂමතා.**

**(අ) ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ස්ථාපිත නොකිරීම.**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මෝටර් වාහන පනතෙහි 213 (අ) වගන්තියට අනුව 2005 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ස්ථාපනය කර තිබුණි. මෙම සභාව 2010 අගෝස්තු මාසයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙනුවට එහි සංයුතිය, ව්‍යුහය හා කාර්යයභාරය ආදිය ඇතුළත් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඇතුළුව කරුණු 04 ක් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, අදාල අනුමැතිය ලැබී වසර 05 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

**(ආ) ව්‍යාපෘති ප්‍රගතිය ලඟා කර නොගැනීම.**

සැලසුම් කළ ව්‍යාපෘති අදාළ කමිටු නිලධාරීන් විසින් වරින්වර අධ්‍යයනය කර එය සැලසුම් කළ කාල සීමාව තුල ඉටු කර ගැනීමට වගබලා ගත යුතු වුවද, සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ රු. මිලියන 10.3 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති සැලසුම් කළ කාල සීමාව තුළ අදාළ ප්‍රගතිය කරා ලගා වීමට නොහැකි වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය .**

**5.1 ක්‍රියාකාරි සැලැස්ම .**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයන්ට තොරතුරු ඇතුළත් කිරීමට පෙර වාර්ෂික පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර එම වියදම් ඇස්තමේන්තුවලට ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 22.4 ක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, අයවැය ලේඛනයේ ඇස්තමේන්තු කර තිබුණේ රු.මිලියන 6.15 කට අදාල සැලසුම් පමණි. ඒ අනුව රු.මිලියන 16.25 ක මුදලක් අඩුවෙන් ඇස්තමේන්තු කිරීම තුලින් නිසි අධ්‍යනයකින් සැලසුම් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) **ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම.**

---------------------------------------------------------------------

සභාවේ ව්‍යාපෘති නිසි පරිදි අනුමත කර ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ උප ව්‍යාපෘති 23 න් 15 ක එනම් රු. මිලියන 12.1 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත උප ව්‍යාපෘති අදාළ වර්ෂයේදී ආරම්භ කිරීමටද, කටයුතු කර නොතිබුණි.

(ඇ) **අනුමත නොවූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

-------------------------------------------------

ප්‍රාග්ධන ව්‍යාපෘති අනුමත කිරීමෙන් පසු ඒ සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, සභාව විසින් එසේ අනුමැතියකින් හා ක්‍රියාකාරී සැලැස්මකින් හා වියදම් ඇස්තමේන්තුවකින් තොරව පාපැදිවල ස්ටිකර් ඇලවීමේ වැඩසටහන හා ජාත්‍යන්තර අබාධිත දිනය වෙනුවෙන් වූ වැඩසටහන යන වැඩසටහන් 02 වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙලින් රු.1,943,202 ක් හා රු. 418,566 ක වියදම් කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

---------------

1971 අංක 38 දරණ මුදල් පනතේ 8 (1) වගන්තියට අනුව ගිණුම් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට ප්‍රථම අයවැය ලේඛනයක් සකස් කර එය පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවද, සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. මිලියන 31.5 ක ආදායම් සහ රු. මිලියන 9.9 ක වියදම් වෙනුවෙන් සකස් කළ ඇස්තමේන්තු සඳහා පාලක මණ්ඩලය හෝ එසේ පාලක මණ්ඩලයක් නොමැති නිසා අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්.

සභාවේ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර තිබූ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව සභාවේ විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ආයෝජනය හා පොළී ගණනය කිරීම.

(ඇ) රක්ෂණ සමාගම් වලින් ලැබෙන දායකය හඳුනා ගැනීම හා ප්‍රේෂණය කර ගැනීමේ ක්‍රියාවලිය.

(ඈ) වන්දි ගෙවීමේ ක්‍රියාවලිය.

(ඉ) අයවැය පාලනය.

(ඊ) අත්තිකාරම්.

û$.ûÜ.´$. à'æ *2015/26* - 2 <`ùÚ æ$óßò× - III- µæ$ð& - Ø$í] &'&ßö$ -
Ñèóæ$½ûõÚ<Ø×$µèß <$Ìõ$< 2014